O

UNIVERSITY OF CAMBRIDGE INTERNATIONAL EXAMINATIONS
General Certificate of Education Ordinary Level

**SINHALA** **3205/02**

Paper 2 Translation and Reading Comprehension **May/June 2012**

**1 hour 30 minutes**

Additional Materials: Answer Booklet/Paper

*2724231539*

**READ THESE INSTRUCTIONS FIRST**

If you have been given an Answer Booklet, follow the instructions on the front cover of the Booklet.
Write your Centre number, candidate number and name on all the work you hand in.
Write in dark blue or black pen.
Do not use staples, paper clips, highlighters, glue or correction fluid.

Answer **all** questions.

At the end of the examination, fasten all your work securely together.
The number of marks is given in brackets [ ] at the end of each question or part question.

This document consists of **4** printed pages and **4** blank pages.

DC (NH/LEO) 52223/3
© UCLES 2012

UNIVERSITY *of* CAMBRIDGE
International Examinations

**[Turn over**

**BLANK PAGE**

© UCLES 2012

## Section A – Translation

**1** Translate into **English**:

ලියුම් කරු පාර්සලයක් භාර දී යනවාත් සමග බල්ලා දොරෙන් එළියට පැන යනු කුඩා පිරිමි ළමයා දුටුවේ නැත. බල්ලා ලියුම් කරු පසු කරමින් වලිගය වනමින් පාර දිගේ දිව්වේය. කිසිවෙකු පෙනෙන්ට නොසිටියත් ලියුම් කරු සිතුවේ බල්ලාගේ අයිති කරු පිටු පසින් එනවා ඇත කියායි. බල්ලා වංගුවෙන් නොපෙනී යද්දී පිටු පසින් කිසිවෙකු අඬනවා ලියුම් කරුට ඇසුණි. ආපසු හැරී බැලූ විට බල්ලාගේ අයිති කරුගේ පුතා වූ කුඩා පිරිමි ළමයා ඔහු දුටුවේය. “මගේ බල්ලා පෙනෙන්ට නෑ. ඌ කොහේ ගියා ද දන්නෙ නෑ” කියමින් ළමයා ඇඬුවේය. “මට පුළුවන් ඌ හොයා ගන්න උදව් කරන්න” යි ලියුම් කරු කාරුණිකව කීවේය. දෙදෙනා ම වංගුව වටේ දිව්වෝය. කුඩා පිරිමි ළමයා බල්ලාගේ නම කියමින් අඬ ගැසුවේය. විනාඩියකට පසු බල්ලා කාගේ දෝ ගෙදරක සිට වලිගය වනමින් එළියට දුවගෙන ආවේය. ළමයා ඌ බදා ගත්තේය. ඉන් පසු ලියුම් කරු ඒ දෙදෙනා ඔවුන්ගේ නිවසට කැටුව ගියේය.

[10]

**2** Translate into **Sinhala**:

Nalin and Malini were looking for a new house that they could afford to buy. They had lived for three years in a small rented house which had no garden. But now, Malini was pregnant and they wanted a bigger house with an extra bedroom and a little garden.

One Saturday, Nalin and Malini went for a walk in an area of town that they liked, but they couldn’t find any houses for sale. Tired after their walk, Nalin bought ice creams and they sat down on the front wall of a pretty little house to eat them. Malini said to Nalin that the baby would arrive soon and that perhaps they should forget moving house for now. Nalin unwillingly agreed.

Behind them, they did not notice the old lady who had appeared in the garden of the little house. “I heard you both talking,” she said. “I have been thinking about selling this place.” Nalin and Malini looked at each other. “I am not sure we could afford this,” said Malini sadly.

“Well, come and look around and then we can discuss that later,” the old lady said.

Twenty minutes later, Nalin and Malini emerged from the house and thanked the old lady warmly.

[20]

© UCLES 2012

[Turn over

## Section B – Reading Comprehension

Read the following passage carefully and then answer the questions in **Sinhala**.

ඉන්දියාවේ අගනුවර වන දිල්ලියේ ඉතිහාසය ක්‍රිස්තු පූර්ව යුගය දක්වා අතීතයට දිවෙයි. තෝමාර් රාජවංශය ක්‍රි.ව. 800 සිට දිල්ලිය පාලනය කළේය. තෝමාර් අනංග් පාල් රජතුමාගේ නම දිල්ලියේ යකඩ කුළුණේ කොටා තිබන අයුරු අද පවා දැක ගත හැකිය. 17 වන සියවසේ සිට 19 වන සියවස තෙක් පැවති මෝගල් අධිරාජ්‍යයේ ප්‍රාකාරවලින් වට වූ මහා නගරය පුරා සොහොන් හා බලකොටු පැතිර පවතින අතර ඒවායින් වැඩි හරියක් නටබුන් වශයෙන් හෝ පසුව සෑදූ වෙනත් ගොඩනැගිලිවලට යට වී හෝ ඇත. යමුනා නදිය ගලා බසින නැගෙනහිර පැත්තේ ප්‍රාකාරයක් නොවූ හෙයින් සියවස් ගණනාවක් තිස්සේ ක්‍රමානුකූලව මේ නගරය කොල්ල කෑමට ගොදුරු වී ඇත.

1947 දී ඉන්දියාව නිදහස ලැබූ පසු ජාතික අගනුවර බවට නිල වශයෙන් පත් වූයේ නව දිල්ලියයි. පැරණි දිල්ලියට වඩා හාත්පසින් ම වෙනස් ශෛලියකට අනුව නව දිල්ලිය ගොඩ නගා ඇත. දෙපස තුරු පෙළින් සෙවණ වූ පුළුල් වීදි, විශාල වෙළඳ මධ්‍යස්ථාන, ඉන්දියා දොරටුව හා ජනාධිපති මන්දිරය වන රාෂ්ට්‍රපති භවාන් වෙත දිවෙන, උත්සව සඳහා සකස් කෙරුණු මාර්ග ද නගරයේ අභිනවයෙන් ඉදි වූ කොටසේ නිමවා ඇත.

මුළු ජීවිත කාලය පුරාම දිල්ලියේ ජීවත් වූ රාම් ශර්මා මෙසේ කියයි: "මේක හරි පුදුම තැනක්. විශාල කඩ වීදි, සිය ගණන් කෑම කඩ, මිනිස්සු පිරුණු ලොකු පාරවල්. ඇත්තෙන් ම දිල්ලිය ජීවය පිරී ඉතිරී යන තැනක්. සමහර විදේශීය සංචාරකයෝ මෙහේ ආවම මුලින්ම බය වෙනවා: බයිසිකල්, ටැක්සි වෙනත් නොයෙක් රථ වාහනවලින් බේරිල තමන්ට ඕනෑ පාර හොයා ගන්නෙ කොහොම ද කියල ඒ ගොල්ලො බය වෙනව. නතර වෙන්න හොඳ ම තැන් මොනවා ද, කන්න හොඳ ම කෑම වර්ග මොනවා ද කියල ඒ අයට හිතා ගන්න බැරි වෙනව. මුල දි තමන් අතරමං වුණා වගේ දැනෙනව.

දිල්ලි නුවර බලන්න, කරන්න දේ ගොඩක් තියෙනව. මෙහේ බලන්න තියෙන හොඳ දේවල් පුළුවන් තරං බලා ගන්න ඕන නං හොඳ ම විදිය තමයි යන්න ඕන තැන් ගැන හොඳට දන්න රියැදුරෙක් එක්ක ටැක්සියක් ගන්න එක. එතකොට දවස් දෙකක් ඇතුළත හොඳ තැන් වැඩි ගණනක් බලා ගන්න පුළුවන්. දිල්ලියෙ දි හොඳට ම සතුටු වෙන්න ඕන නං දවස් දෙක තුනකට වඩා ඉන්න ඕනෑ.

දිල්ලි නගරෙ සමහර තැන්වලට, ඔබ කැමති නං රික්ෂෝවක යන්න පුළුවන්. රික්ෂෝවෙ ගමන හෙමින් වුණත් ටැක්සියක යනවාට වඩා හොඳින් ලස්සණ තැන් ගොඩාක් බලා ගන්න හැකි වෙනව. ඔබට මාරුවෙන් මාරුවට උමං දුම්රියේ යන්නත් පුළුවන්. රික්ෂෝවට වඩා ඒක හුඟක් ලාබයි. ඒත් දිල්ලිය හොඳට දන්නෙ නැත්නං බහින්න ඕනෑ නැවතුම් පොළ දැන ගන්න එහෙම අමාරුයි."

"දිල්ලිය බලන්න එන බොහෝ දෙනෙකුට ඕනෑ වෙන්නෙ අග්‍රාවෙ ටාජ් මහල් බලන්න. ඒත් රතු කොටුව, කුටුබ් මිනාර් සහ රාජ් ඝාත් වගේ තවත් බැලිය යුතු තැන් රාශියක් ම දිල්ලියේ තියෙනව."
රාම් තව දුරටත්: "තෝරා ගන්න විකල්ප ගොඩක් දිල්ලියේ තියෙනව- දිල්ලිය මේ තරං ආකර්ෂණීය වෙලා තියෙන්නෙත් ඒ නිසා. මම නං කැමති ම දේවල් තමා මේ නගරෙ ගඳ සුවඳ, කෑම ඉදෙන ලිප ගිනි, සර්ම කලාපීය මල්, සුවඳ වර්ග. ඒක ඉන්ද්‍රජාලිකයි."

© UCLES 2012

Now answer the following questions in **Sinhala** using your own words as far as possible.

**3** මේ ලිපියට අනුව දිල්ලිය පාලනය කළේ කුමන කණ්ඩායම් ද? [2]

**4** මෝගල් පාලන සමයට අයත් දිල්ලියේ භූමි ලක්ෂණ දෙකක් විස්තර කරන්න. [2]

**5** දිල්ලිය කොල්ලකෑම්වලට පහසුවෙන් ගොදුරු වූයේ කුමක් නිසාදැයි ඔබ සිතන්නෙහි ද? [1]

**6** පැරණි දිල්ලියට වඩා නව දිල්ලිය වෙනස් ශෛලියක නගරයක් ලෙස මේ ඡේදයේ විස්තර කෙරේ. එහි දී දැක්වෙන වෙනස්කම් 3 ක් පෙන්වා දෙන්න. [3]

**7** රාම්ට අනුව, දිල්ලිය ජීවත් වීමට සුදුසු ක්‍රියාශීලී තැනක් බවට පත් වන්නේ කුමන හේතු නිසා ද? එබඳු හේතු දෙකක් සඳහන් කරන්න. [2]

**8** දිල්ලියට පැමිණෙන විදේශීය සංචාරකයින් බියට පත් වන්නේ මන්දැයි පැහැදිලි කරන්න. [3]

**9** දර්ශන නැරඹීමට යාම සඳහා රථයක් හා රියැදුරකු කුලියට ගැනීමේ වාසි හා අවාසි 1 බැගින් සඳහන් කරන්න. [2]

**10** දිල්ලිය නැරඹීමට යාම සඳහා යොදා ගත හැකි ක්‍රම ගැන රාම් 5 වැනි ඡේදයේ කථා කරයි. ඔහු වඩා කැමති ප්‍රවාහන ක්‍රමය කුමක් ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. [2]

**11** මේ ලිපියට අනුව ටාජ් මහල් හැරුණු විට සංචාරකයින් නැරඹීමට කැමති වෙනත් ස්ථාන මොනවා ද? දෙකක් නම් කරන්න [2]

**12** රාම් දිල්ලියේ වඩාත් ම කැමති දේ මොනවා ද? [1]

Language and Spelling [5]

**Total [25]**

**BLANK PAGE**

© UCLES 2012

**BLANK PAGE**

© UCLES 2012

**BLANK PAGE**

Permission to reproduce items where third-party owned material protected by copyright is included has been sought and cleared where possible. Every reasonable effort has been made by the publisher (UCLES) to trace copyright holders, but if any items requiring clearance have unwittingly been included, the publisher will be pleased to make amends at the earliest possible opportunity.

University of Cambridge International Examinations is part of the Cambridge Assessment Group. Cambridge Assessment is the brand name of University of Cambridge Local Examinations Syndicate (UCLES), which is itself a department of the University of Cambridge.

© UCLES 2012